# Abstract No 80

## අභිඥාන ශාකුන්තලය නාට්‍යයෙහි ප්‍රතිනිර්මිත කාන්තාව

**එරංග කෞශල්‍ය ගොඩකන්ද ආරච්චි,**
විශේෂ (දෙවන), සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
erangakaushalya92@gmail.com

අභිඥානශාකුන්තලය කාලිදාසයන්ගේ විශිෂ්ට නිර්මාණයකි. මහාභාරතයේ ශකුන්තලෝපාඛ්‍යානය ඊට විෂය වී ඇත. අභිඥාන ශාකුන්තලයේ කාන්තා චරිත ප්‍රතිනිර්මිත ආකාරය විමර්ෂණය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. මූලාශ්‍රය පදනම් කොටගෙන නිර්මාණය වූ නාට්‍යයක් වුව ද, නාට්‍යකරුවා නව දෘෂ්ටියකින් කාන්තා චරිත නිරූපණය කර ඇති ආකාරය දක්නට ලැබීම එහි වැදගත්කමයි. කාන්තා චරිත කෙතෙක් දුරට ප්‍රතිනිර්මාණය වී තිබේ ද යන්න මෙහි මූලික ගැටලුවයි. මෙම පර්යේෂණයේ ක්‍රමවේදය ලෙස ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිත කෙරේ. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ඩී.ඊ. හෙට්ටිආරච්චි හා පියදාස නිශ්ශංක පරිවර්තනය කළ 'සාකුන්තලා' නාට්‍ය පෙළ හා මහාභාරතයත්, ද්විතීයික මූලාශ්‍රය ලෙස ඒ පිළිබඳ ලියැවුණු විචාර ග්‍රන්ථත් භාවිත කෙරේ. මෙම අධ්‍යයනයේ දී අප එළෙඹි නිගමනය වන්නේ කාලිදාස මූලාශ්‍රයන්හි ඇති කාන්තා චරිතයට වඩා මානුෂීය වූ ද, සෞන්දර්යයෙන් පරිපූර්ණ වූ ද කාන්තා චරිත ප්‍රතිනිර්මාණය කර ඇති බවයි. එමෙන් ම මූලාශ්‍රයන්හි සඳහන් නොවන අනුසූයා, ප්‍රියංවදා වැනි කාන්තා චරිත ප්‍රතිනිර්මාණය කරයි. සියලු කාන්තා චරිත ප්‍රතිනිර්මාණය කර ඇත්තේ භාරතීය සමාජයට කාන්තාව පිළිබඳ නව අර්ථකථනයක් ලබා දීමට බව මෙම පර්යේෂණයේ දී අනාවරණය වූ තවත් වැදගත් කරුණකි.

**ප්‍රමුඛ පද:** ප්‍රතිනිර්මාණය, මහාභාරතය, සෞන්දර්යය, ශාකුන්තලය, භාරතීය සමාජය